වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
வியாபார மற்றும் முதலீட்டுக் கொள்கைத் திணைக்களம்
Department of Trade and Investment Policy

මහලේකම් කාර්යාලය, කොළඹ - 01
செயலகம், கொழும்பு - 01
The Secretariat, Colombo -01

මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
Ministry of Finance

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. – TIP/TP/01/12 (23) | ඔබේ අංකය / உமது இல / Your No. – | දිනය / திகதி / Date – 2019.09.10 |

රේගු අධ්‍යක්ෂ ජනරාල් මගින්
රජයේ මුද්‍රණාලයාධිපති

මහත්මයාණි

**1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත යටතේ වන ගැසට් නිවේදනය**

ගරු මුදල් අමාත්‍යතුමා විසින් 2019 සැප්තැම්බර් මස 11 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පනවනු ලබන 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත යටතේ වන ගැසට් නිවේදනය 2019.09.10 දිනැති අංක 2140/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන්ම සකස් කර මේ සමග එවමි.

මෙම නිවේදනයේ සෝදුපත් කියවීම සඳහා කොළඹ 01, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අමතනු මැනවි (කාර්යාලයීය දුරකථන අංකය 2484930 වේ).

මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පල කිරීමෙන් පසුව ඉන් පිටපත් 525 ක් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතද, පිටපත් 25 ක් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙතද එවනු මැනවි.

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ විධි විධාන අනුව අප්‍රමාදව පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළයුතුව ඇති බැවින් මුද්‍රිත පිටපත් ඉතා ඉක්මනින් මා වෙත ලැබෙන්නට සලස්වන්නේ නම් කෘතඥ වෙමි.

මෙයට - විශ්වාසී

සී. ජයසූරිය
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත්** - 1.රේගු අධ්‍යක්ෂ ජනරාල්, මේ සමග එවනු ලබන 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත යටතේ වන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සහ අවශ්‍ය කටයුතු සඳහා

2. ලේකම්, කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

3.අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව - *අවශ්‍ය කටයුතු සඳහා*

4.ආනයන හා අපනයන පාලක ජනරාල්, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව- *අවශ්‍ය කටයුතු සඳහා*

5..අධ්‍යක්ෂ ජනරාල්, වානිජ දෙපාර්තමේන්තුව - *වෙළඳ තොරතුරු ද්වාරය (Trade Information Portal) දැනුවත් කිරීම සඳහා*

දුරකථන අංකය / தொலைபேசி / Telephone – 0112 484 888
ෆැක්ස් / தோலைநகல / Fax – 0112 484 830
විද්‍යුත් තැපෑල / மின்-அஞ்சல் / e-mail – admin@tipd.treasury.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website – www.treasury.gov.lk

# රේගු නිවේදනයයි

## ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 03/2019

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් පනවන ලද පහත සඳහන් ආඥාව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

ආර්. එච්. එස්. සමරතුංග
ලේකම්
මුදල් අමාත්‍යාංශය

2019 සැප්තැම්බර් මස .....10..... වැනි දින
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේදීය.

## 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත

## ආඥාව

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය මංගල සමරවීර වන මම, 2019 සැප්තැම්බර් මස ...11.... වැනි දින සිට, මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයෙහි 5 වැනි තීරුවේ අනුරූප සටහන් වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අයකළ යුතු වන හා ගෙවිය යුතු වන අවස්ථාවක නම් එකී උපලේඛනයෙහි 4 වැනි තීරුවෙහි අනුරූප සටහන් වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව, ආනයන තීරු ගාස්තු අයකළ යුතු බව හා ගෙවිය යුතු බවට ද, රේගු අධ්‍යක්ෂ ජනරාල්ට මෙමඅ ආඥාව මගින් නියම කරමි.

මංගල සමරවීර
මුදල් අමාත්‍ය

2019 සැප්තැම්බර් මස ....10 වන දින
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේදීය.

# උපලේඛනය

| ශීර්ෂ අංකය (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (2) | | විස්තරය (3) | තීරුබදු ප්‍රමාණය | | ප්‍රමාණ ඒකකය (6) |
|---|---|---|---|---|---|---|
| | | | | වරණීය (4) | සාමාන්‍ය (5) | |
| **07.13** | | | **පිට කුරුවට ඉවත් කළ හෝ නොකළ පියලි කළ හෝ නොකළ හෝ පොතු ගැලවූ වියළි රනිල එළවළු.** | | | |
| | | --- | උඳු | | | |
| | 0713.31.21 | ---- | රසායනික පිළියම් කිරීම් මගින් වැපිරීම සඳහා සහතික කරන ලද හා ආහාරයට ගැනීමට නුසුදුසු බවට සලකන බෝංචි වර්ගයේ ඇට. | | නිදහස් | කි.ග්‍රෑ. |
| | 0713.31.22 | ---- | පියළි කළ | | 15% | කි.ග්‍රෑ. |
| | 0713.31.29 | ---- | අනෙකුත් | | 15% | කි.ග්‍රෑ. |
| | | | | | | |
| **24.01** | | | **නිෂ්පාදනය නොකළ දුම්කොළ; දුම්කොළ අපතයන්.** | | | |
| | | | | | | |
| | 2401.10 | - | නාරටි නොකැපූ, නොඉරූ, දුම්කොළ | | 85% හෝ කි.ග්‍රෑමයට රු 165/- | කි.ග්‍රෑ. |
| | 2401.20 | - | සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් නාරටි කැපූ / ඉරූ, දුම්කොළ | | 85% හෝ කි.ග්‍රෑමයට රු 165/- | කි.ග්‍රෑ. |
| | 2401.30 | - | දුම්කොළ අපතයන් | | 85% හෝ කි.ග්‍රෑමයට රු 165/- | කි.ග්‍රෑ. |